**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව, එක් පන්තියකට අයත් වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට අදාළ වත්කම් පන්තිය එකවර ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, ඊට පටහැනිව කොටස් වශයෙන් ප්‍රත්‍යාගණනය සිදු කර තිබුණි. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට මුළු පිරිවැය රු.130,951,185 ක් වූ ගොඩනැගිලි එහි පිරිවැයටත් මුළු පිරිවැය රු.21,920,729 ක් වූ ගොඩනැගිලි එහි ප්‍රත්‍යාගණනය අගයටත් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරින් පැමිණීම මත ඉදිරියේදි ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩුතරමින් සෑම වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.43,265,362 ක් වූ මෝටර් වාහන (ජංගම නොවන වත්කම්) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණයෙන් පෙන්වා දුන් පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව අදාල ප්‍රතිශෝධනයන් කඩිනමින් සිදු කර මූල්‍ය ප්‍රකාශය තුළ ගැලපීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 42 ඡේදයට පටහැනිව පරිත්‍යාග මත ඉදිකෙරෙමින් පවතින නව දිගන්ත ප්‍රතිකාර පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ඇස්තමේන්තුගත පිරිවැය | කෙරීගෙන යන වැඩවල වර්තමාන වෙළඳපොළ වටිනාකම ගණනය කළ යුතු බැවින් තක්සේරු | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව |

| | | | |
|---|---|---|---|
| | රු.5,816,589 ක් වූ අතර ඉදිකිරීම් කටයුතු සඳහා වැයකර ඇති මුදල රු. 3,598,600 ක් වුවද ගොඩනැගිල්ල ඉදිකිරීම් පිරිවැය දැක්වීම වෙනුවට ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම රු.4,500,000 ක් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුවෙන් කරන ලද ඉල්ලීමකට අනුව රු. 4,500,000 තක්සේරු වටිනාකමක් ලැබුණි. ඒ අනුව එම අගය අවසන් ගිණුම් වල සටහන් කිරිමට කටයුතු කරන ලදි. | කටයුතු කළ යුතුය. |
| (ඇ) | UNODC ගොඩනැල්ල හා නව දිගන්ත ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා ද්‍රව්‍ය හා මුල්‍ය පරිත්‍යාග ලැබීම් ලේඛණගත කර තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 හි , 97 ඡේදය ට අනුව අත්පත් කරගත් දිනට වූ සාධාරණ අගය මත අයභාරය හදුනා ගැනිම හා 106 ඡේද ප්‍රකාර මුල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරිමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | ශේෂ පත්‍ර දින වන විටත් මෙම ගොඩනැගිල්ල විධිමත් පරිදි නිමකර භාර දී නොතිබු බැවින් අදාළ අගය කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. මේ වන විට විධිමත් පරිදි භාර දී ඇති බැවින් අදාළ ගිණුම් යාවත්කලීන කිරිමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 59 ඡේදය ප්‍රකාරව අනාගත සේවක ප්‍රතිලාභ පියවීම සඳහා එම වගකීම්, වට්ටම් පදනමක් මත මැනිය යුතු වුවත් මණ්ඩලය විසින් සේවක පාරිතෝශික වෙන්කිරීම ගණනය කිරීමේදී මුදලේ වර්තමාන අගය/වට්ටම් ක්‍රමය සැලකිල්ලට ගෙන නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ඉදිරි ගිණුම් වර්ෂයේ දී කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුල්‍ය ප්‍රකාශනවල බදු ඉඩම් සම්බන්ධව අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය නව දිගන්තය පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ කල්බදු ඉඩමට අදාළව පමණක් හෙළිදරව් කර තිබුණි. ඒ අනුව බදු ඉඩම් සම්බන්ධයෙන් මණ්ඩලය අනුගමනය කරනු ලබන ගිණුම්කරන ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | මණ්ඩලය සතු සියළු බදු ඉඩම් සම්බන්ධව සිදු කරන ගිණුම් ප්‍රතිපත්තිය ඉදිරි මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරිමට කටයුතු කරමි. | මුල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලධාරීන් 09 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු රු.6,193,135 ක පාරිතෝශික මුදල ජංගම වගකීම් යටතේ සහ ජංගම නොවන වගකීම් යටතේ පාරිතෝශික වෙන්කිරීම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌණතාවය සහ ජංගම නොවන වගකීම් රු.6,193,135 කින් වැඩියෙන් දැක්වුණි. | ඉදිරියේ දී නිවරදිව ගිණුම්ගත කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | ගෙවිය යුතු පාරිතෝෂික මුදල් නිවරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 අවිනිශ්චිත ගිණුම්

| විෂය | මුදල (රු.) | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| අවිනිශ්චිත ගිණුම | 185,685 | වර්ෂ 09 | ශේෂය හදුනා ගෙන නිරවුල් කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගන්නා බව දන්වා සිටිමි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හැකි ඉක්මණින් හදුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| විෂය | මුදල (රු) | නොසැපයූ විගණන සාක්ෂි | | |
| පොල් ආදායම | 1,734,826 | ආදායම් වාර්තා | පොල් අදායම සැසඳුම් කළ හැකි පරිදි සැසඳුම් ලේඛණයක් ඉදිරියේදී පවත්වා ගෙන යාමට කටයුතු කරමි | ආදායම් වාර්තා යාවත්කාලීනව ගිණුම් අංශය විසින් පවත්වා ගෙන යා යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ පැවති රු.1,087,009 ක හර ශේෂය වර්ෂ 20 කට වඩා වැඩි කාලයක සිට චලනය නොවී පවතින අතර එම ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නොතිබුණි. | මෙම ශේෂයන් සනාථ කර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි මණ්ඩලය සතුව නොමැති අතර කාර්ය මණ්ඩලය යොදවා අදාල ලේඛන සියුම් ලෙස පරීක්‍ෂා කරමින් සිටි. | අත්තිකාරම් ශේෂයෙහි නිරවද්‍යතාවය සනාථ කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2008 අංක 1 දරණ මාදක ඖෂධ සහ මනෝවර්තක නිති විරෝධි ලෙස ජාවාරම් කිරිම සම්මුති පනතේ 18 වැනි වගන්තිය සමඟ 31 වන වගන්තිය හා අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි වගන්තියේ (2) වැනි ඡේදයට අනුව සාදනු ලැබු නියෝග අංක 1653/7-2010 මැයි 10 දින අතිවිශේෂ ගැසට් පත්‍රය | | | |
| i. | නියෝග 5 ඡේද | අධිකාරියේ බලතල කාර්යයන් හා කර්තව්‍යන් ක්‍රියාත්මක කිරිම, ඉටුකිරිම සහ සිදුකිරිම සඳහා අවශ්‍ය විය හැකි ලේකම්වරයෙකු සහ වෙනත් නිලධරයන් සහ සේවකයන් අධිකාරිය විසින් පත්කරනු ලැබිය යුතු වුවද 2022 වර්ෂය අවසන් වන තුරු අවශ්‍ය වන කාර්යය මණ්ඩලය බඳවා ගැනීම් සිදුකර නොමැති අතර නිලධාරින් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. | අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයෙන් එවන ලද ලිපියට අනුව පුරප්පාඩු පිරවීමට ලබා දී ඇති උපදෙස් අනුව, 2023 මැයි 23 දින යොමු අංක NDDCB/HR/01/02-1 දරණ ලිපිය මඟින් අවශ්‍ය කරුණු යළි රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| ii. | නියෝග 8 ඡේදය හා නියෝග 10 ඡේදය | 2008 අංක 1 දරණ මාදක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධි ලෙස ජාවාරම් කිරිමට එරෙහි සම්මුති පනතේ විධිවිධාන වලට යටත්ව අධිකාරිය රැස්විම්වල කටයුතු කිරිම සම්බන්ධව අනුගමනය කල යුතු වන අතර නියෝග 10 ඡේද ප්‍රකාරව එහි කාර්යයන් පිළිබඳ පුරෝගාමී අධිකාරියේ මණ්ඩලයේ සාමාජිකයන් විසින් | ඉදිරි කටයුතු විගණන නිරීක්ෂණයේ පෙන්වා දුන් පරිදි ක්‍රියාත්මක කිරීමට උපදෙස් හා අනුමැතිය 2023 මැයි 23 දින ජොෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීමේ දී ලබා දී ඇත. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සමාලෝචනය සිදු කළ යුතු වුවද එසේ සිදු කර නොතිබුණි. | | |
| iii. | නියෝග 13 ඡේදය | අධිකාරියේ සමාජිකයින් විසින් අවම වශයෙන් මාස තුනකට වරක්වත් බලපත්‍රලාභියාගේ ලියාපදිංචි කරනු ලැබූ පරිශ්‍රයට පැමිණ උපලේඛණයේ ද්‍රව්‍ය භාවිතා කරගෙන යන්නා වූ ක්‍රියාකාරකම් පිළිබඳව අධික්ෂණය හා ද්‍රව්‍ය ගබඩා කර ඇති ආකාරය බලපත්‍රලාභියා පවත්වාගෙන යන පොත් ලේඛණ සහ වාර්තා පරික්ෂා කල යුතු වුවත් 2022 වර්ෂයේ පරිශ්‍ර 636 කින් 24 ක් පමණක් පරික්ෂා කර තිබුණි. තවද පරිශ්‍ර සඳහා බලපත්‍ර ලබා ගැනිමට ලියාපදිංචි වි තිබුණු ආයතන 18 කට බලපත්‍ර ලබා දිමට ස්ථානීය පරික්ෂාවට යාමට නොහැකි විම නිසා බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි වී තිබුණි. | විගණන නිරික්ෂණය පරිදි අදාල කටයුතු විධිමත්කරණය කිරීමට අවශ්‍ය පියවර කඩිනමින් ගනු ලැබේ. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2007 අංක 54 දරණ ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පනතට අනුසාංගිකව නිකුත් කරන ලද 2010 මැයි 10 දිනැති අංක 1653/19 -2010 ගැසට් පත්‍රය | 2022 වර්ෂය වන විට පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන 26 ක බලපත්‍ර වලංගු කාලය අවසන් වී තිබු අතර මධ්‍යස්ථාන වල බලපත්‍ර අලුත් කිරිම සඳහා පවතින අවම ප්‍රමිතීන් තවදුරටත් සංවර්ධනය කිරිමට කාලය ලබා දී තිබුණද 2022 වර්ෂයේ දී කිසිදු මධ්‍යස්ථානයක බලපත්‍ර අලුත් කර නොතිබුණි. | 2023 වසරේ අප්‍රේල් මස වන විට පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන නැවත විමර්ශනය කර බලා අවම ප්‍රමිතීන් සංවර්ධනය කර ඇති ප්‍රතිකාර මධ්‍යස්ථාන 08 ක බලපත්‍ර අලුත් කිරීම සිදුකර ඇත. ජුනි මස තුළ බලපත්‍ර අලුත් කිරීමට නියමිත අනෙකුත් පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානවල බලපත්‍ර අලුත් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව සාධන ලැබූ නියෝග අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ 15.1 ඡේදය හා රාජ්‍ය කොමිෂන් සභා චක්‍රලේඛ 03/2016 | සංශෝධිත සේවා ව්‍යවස්ථා අනුව බඳවා ගනු ලබන නිළධාරින් වසර 03 ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු වුවත් ආයතනය විසින් 2019 මැයි 26 දින කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වා තිබු අතර ඉන් පසු | ඉදිරියේ දී විගණන නිරික්ෂණ මඟින් පෙන්වා දුන් ආකාරයට ක්‍රියාකරමි. | ආයතන සංග්‍රහයට හා අදාල චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | විභාග පවත්වා නොතිබුණි. වර්ෂ 03 තුල කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ නොකළ නිළධාරින් 137 ක් ආයතනයේ සේවයේ යෙදී සිටින අතර මෙම නිලධාරීන් සඳහා වාර්ෂිකව වැටුප් වර්ධක ලබා දීමට කටයුතු කර තිබුණි. | | |
| (ඇ) | 1983අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ 11 කොටසේ | | | |
| i. | 5(1) උප වගන්තිය | මණ්ඩලයේ සේවය අවසන් කරන ලද නිලධාරීන්ට සේවය අවසන් කරන ලද දින සිට දින 30 ක කාලයක් ඇතුලත පාරිතෝෂික ගෙවා අවසන් කල යුතු වුවත්, 2022 වර්ෂය තුල දී නිලධාරීන් 09 ට රු.3,010,131 මුදලින් ගෙවා තිබූ අතර ඒ සඳහා ප්‍රමාද කාලය මාස 01 සිට මාස 15 දක්වා කාල පරාසයකට විහිදී තිබුණි. නිලධාරීන් 5 දෙනෙකු සඳහා උපචිත කර තිබූ පාරිතෝෂික වටිනාකම රු.4,281,615 ක් සඳහා 2023 වර්ෂයේ ගෙවීම් සිදු කර තිබූ ප්‍රමාද කාලය මාස 01 සිට 03 දක්වා කාල පරාසයක විහිදී තිබීම මත පනත ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මණ්ඩලයට ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හේතු කොටගෙන මෙවැනි ප්‍රමාදයක් සිදු වන බව කාරුණිකව දන්වමි | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| ii. | 5 (2) (1) වන උප වගන්ති | සේවායෝජකයකු වෙත නියම කරන ලද බැදීම් ඉටු කිරීමට පෙර ඒ සේවා යෝජකයාගේ මරණය සිදු වූ විටෙක, ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා විසින් ඒ බැදීම ඉටු කරනු ලැබිය යුතු වුවද මරණයට පත් සේවකයින් දෙදෙනෙකු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මියගිය සේවකයන් දෙදෙනාගේ පාරිතෝෂික හිමිකම සම්බන්ධව මෙතෙක් ඉල්ලීම් ඉදිරිපත් නොවූ බැවින් ගෙවීම් කර නොමැති බව කාරුණිකව දන්වමි. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 880 | ආයතනයේ ඇප තැබීමට අවශ්‍ය නිළධාරින් මණ්ඩලය විසින් හඳුනා ගෙන නොමැති අතර, (612 වැනි අධිකාරය) රජයේ නිළධාරීන්ගේ ඇප ආඥා පනත අනුව ඇප තබා නොතිබුණි. | මු.රෙ 880 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හඳුනාගෙන ඇප තැබීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.48,359,337 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,018,049 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.63,377,386 ක පිරිහිමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මාදක ඖෂධ වලට ඇබ්බැහි වූ තැනැත්තන්ට ප්‍රතිකාර හි පුනරුත්ථාපනය සඳහා වූ වියදම රු. 21,198,901 කින් ඉහළ යාම සහ විවිධ ආදායම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල් වල සමාජිකයින් සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් ලබා දීම, අවශ්‍ය මූලික මට්ටමේ මැදිහත්වීම් සිදු කිරිම ,අවශ්‍ය ප්‍රතිකාර සේවාවන් (ප්‍රතිකාර මධ්‍යස්ථාන / මනෝවෛද්‍ය සායන සහ වෙනත් අවශ්‍ය සේවාවන් ) වෙත යොමු කිරිම සහ තොරතුරු ලබා දීමේ අරමුණින් 2020 වර්ෂයේ මාර්තු මස අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ 1927 දුරකථන උපදේශන සේවා ඒකකය ආරම්භ කර තිබුණි. සේවා සැපයීමට සිටින නිලධාරීන් සිමීත වීම මත මෙම දුරකථන උපදේශන ඒකකයේ ප්‍රගතිය 2021 වර්ෂයට වඩා 2022 වර්ෂයේදී සියයට 38 කින් අඩු වී තිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණ ඵලදායි ලෙස ඉටු නොවන බව නිරීක්ෂණය විය. | සේවය සැපයීමට සිටින නිලධාරීන් සංඛ්‍යාව සීමිතවීම මත අදාළ කාලය තුළ ඇමතුම් සංඛ්‍යාවේ අඩුවීමක් සිදුවී ඇත. දැනට පවතින කාර්යමණ්ඩල හිඟය සැළකිල්ලට ගනිමින් විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් සීමාවාසික පුහුණුව යටතේ හෝ ස්වේච්ඡා පදනම මත කණ්ඩායමක් සම්බන්ධ කරගනිමින් අවශ්‍ය තාක්ෂණික පුහුණුවීම් යටතේ සේවාවන් සැපයීමට යොදවා ගැනීමට සැළසුම් කර ඇත. | දුරකථන අංක 1927 උපකාරක සේවාව නිසි පරිදි ක්‍රියාත්මක වීමට අවශ්‍ය පහසුකම් සැපයිය යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයට අයත් "නව දිගන්ත" ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයකින් රු.5,000,000 ක පරිත්‍යාග මුදලක් 2021 වර්ෂයේදී ලැබී තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු සඳහා රු.8,948,612 ක ඇස්තමේන්තුවක් සකසා තිබූ අතර ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදා ශ්‍රම දායකත්වයෙන් සිදු කිරීම වෙනුවෙන් රු.3,132,014 ක් අඩුකර රු.5,816,589 ක පිරිවැය ඇස්තමේන්තුවක් සකසා තිබුණි. ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු.3,598,600 ක් වැය කර තිබුණද, ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කර තිබුණි. 2022 මාර්තු 25 දින භෞතිකව සිදු කරන ලද පරීක්ෂණ කමිටු වාර්තාව අනුව මිලදී ගත් ද්‍රව්‍ය වලින් රු.1,310,475 ක් වටිනා ද්‍රව්‍ය වැඩ බිමෙහි ඉතිරිව තිබුණි. ඒ අනුව පරිත්‍යාග වශයෙන් ලද මුදල් ආර්ථික හා ඵලදායී ලෙස යොදවා ගෙන නොමැති බව නිරීක්ෂණය විය. තවද, මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නතර කිරීම නිසා ද්‍රව්‍ය ආධාර වශයෙන් ලැබී තිබූ සිමෙන්ති මළු 100 ක් UNODC ආධාර මත ඉදි කෙරෙමින් පවතින ගොඩනැගිල්ලක් වෙත ලබා දීමට මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණි. | වැඩබිමක කටයුතු සිදු කරන විට යම් යම් ඉතිරි වීම් හෝ ඌනතාවයන් අපේක්ෂා කළ හැකිය. නමුත් මෙය ඵලදායී ලෙස යොදවා ගැනීම පිණිස මෙවැනිම ආධාර මත ඉදිවන UNODC ගොඩනැගිල්ල වෙත ලබා දීමට මණ්ඩලය විසින් තීරණය කර ඇත. | පරිත්‍යාග වශයෙන් ලද මුදල් ආර්ථික හා ඵලදායී ලෙස යොදවා ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 අංක 54 දරණ ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර පුනරුත්ථාපනය) පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා 2022 ජනවාරි 24 දින පැවති ආමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අමප/21/2279/303/176 ප්‍රකාරව පනතට අදාළ සංශෝධන කටයුතු නිම කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | නීති කෙටුම්පත් සම්පාදක විසින් අවසන් සංශෝධිත කෙටුම්පත සකසා ඉදිරිපත් කර ඇති අතර ඉංග්‍රිසි පරිවර්තනය ද සහිතව 2023 මැයි 02 දින අධිකරණ අමාත්‍යාංශය හා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | පනතට අදාල සංශෝධන කිරීම කඩිනමින් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථානය) පිළබඳ පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව නිතී ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වයට පත් තැනැත්තන් අතරින් හෝ අන්තරාදායක ඖෂධ ඇබ්බැහිය හා සම්බන්ධ කායික විද්‍යාත්මක හෝ සමාජ ගැටළු යන පිළිබඳ පලපුරුද්ද හා දැනුම ඇති තැනැත්තන් අතරින් | තුලනීක්ෂණ මූල මණ්ඩලය පත් කිරීම හා ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකමය වශයෙන් ගැටලු සහගත වන බැවින් සංශෝධිත පනත් කෙටුම්පත සකස් කිරීමේදී තුලනීක්ෂණ මූල මණ්ඩලය වෙනුවට තක්සේරු කමිටුවක් පත් කළ යුතු ආකාරය පිළිබඳ ඇතුළත් කරන ලදි. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය |

| | | | |
|---|---|---|---|
| | දහදෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත තුලනික්ෂණ මූල මණ්ඩලයක් පත් කර නොතිබුණි. | | |
| (ඇ) | 2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතේ 4 (02) සහ (03) යන වගන්ති ප්‍රකාරව බලය පැවරී ඇති නිළධාරියෙකුට යුක්ති සහගත වේලාවන්හිදී පනත යටතේ බලපත්‍ර දී තිබෙන හෝ නාමෝද්දිෂ්ඨ යම් ප්‍රතිකාර මධ්‍යස්ථානයකට ඇතුළු වී අවශ්‍ය යයි සලකන පරීක්ෂාවන් සිදු කල හැකි වුවද ආයතන 26 න් 2022 වර්ෂයේදී මධ්‍යස්ථාන 16 ක් පමණක් පරීක්ෂාවට ලක් කර තිබුණ අතර නියමිත කාලාන්තරීය වාර්තා මඟින් ප්‍රතිකාර මධ්‍යස්ථානයෙහි සාර්ථකත්වය පිළිබඳ තොරතුරු මණ්ඩලයේ අවධානයට යොමු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් 2023 මැයි 22 දින ඖෂධ කාර්යය මණ්ඩලය උදෙසා පැවති රැස්වීමේදී, නිවාරණ, අධ්‍යාපන හා පුහුණු අංශයේ හා බාහිරසේවා අංශයේ නිලධාරීන්ගේ සහයෝගය ලබාගනිමින් මධ්‍යස්ථාන නිරීක්ෂණ කටයුතු සිදු කිරීමට යෝජනා කරන ලද අතර, ඉදිරියේ දී පුරප්පාඩු පිරවීමට අවශ්‍ය තීරණ ගන්නා තෙක් මෙම විකල්ප ක්‍රමය යොදා ගනිමින් පෞද්ගලික ප්‍රතිකාර පුනරුත්ථාපන මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීමට සැලසුම් කර ඇත. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 අප්‍රේල් 30 දින, රු.4,085,018 ක බදු වටිනාකමකට තිස් අවුරුදු බදු පදනම මත ලබාගෙන ඇති හෝමාගම පිටිපන ඉඩම වසර 8 ක් ගතව තිබියදීත් යොදාගනු ලැබීමට අපේක්ෂිත කාර්යය නිශ්චිතව නාගරික සංවර්ධන අධිකාරිය වෙත දැනුම් නොදීම හේතුවෙන් මෙම ඉඩම ඵලදායී කාර්යයක යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | රජයේ ප්‍රතිපාදන හෝ මහජන ආධාර මුදල් ලද විගස තාවකාලිකව හෝ ගොඩනැගිල්ලක් ඉදිකර බාහිර සේවා නිලධාරීන් හා උපදේශකයින් යෙදවීමට සැලසුම් කර ඇත. මණ්ඩලය විසින් බදු ඔප්පුව ලබා ගැනීමට අවශ්‍ය ඉල්ලීම් මේ වන විට සිදු කර ඇති අතර, තවදුරටත් මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. | ඉඩම් ඵලදායී කාර්යයන්ට යොදා ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනතේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා 374 කින් යුත් කාර්යය මණ්ඩලයක් අනුමත වී තිබුණද | මේ වන විට අමාත්‍ය මණ්ඩල තීරණය අනුව හා මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 බලපැවැත්වෙන බැවින් මෙම තනතුරු වල පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. මණ්ඩලයේ අත්‍යාවශ්‍ය තනතුරු වල | නිසි අධ්‍යයනයකින් පසුව අනුමත කාර්ය මණ්ඩලය සුදුසු |

| | | |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට තත්‍ය කායීය මණ්ඩලය 225 ක් වූයෙන් එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 149 ක් විය. මේ හේතුවෙන් මණ්ඩලයේ අරමුණු, බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී බලාපොරොත්තු වන කාර්ය සාධනය ලබා කර ගත නොහැකි වී තිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා 2023 මැයි 23 දින යොමු අංක NDDCB/HR/0/02/-01 දරණ ලිපිය මගින් සේවක අවශ්‍යතාවය පුරෝකථනය කර රේඛීය අමාත්‍යාංශය වෙත ලිපි යවා ඇත. | පරිදි සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂය සඳහා මණ්ඩලය අනුමත කර තිබූ ක්‍රියාකාරී සැළැස්ම සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ඇති අංශ 07 න් අංශ 03 ක පමණක් භෞතික ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් විය. පර්යේෂණ අංශයේ යෝජිත වැඩ සටහන් 06 න් වැඩසටහන් 03 ක භෞතික ප්‍රගතිය සියයට 50 ක ආසන්නව පැවතුණි. | කඩිනමින් මෙම වාර්තා විගණනය වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී. | සැලසුම්ගත ක්‍රියාකාරකම් අපේක්ෂිත පරිදි ඉටු කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | නීති විරෝධි මත්ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවාහනය, ජාවාරම, විකිණීම සහ භාවිතයට එරෙහිව නීතිය ඵලදායී ලෙස බලාත්මක කිරීම සඳහා ජාතික මාදක රසායනාගාරය ක්‍රියාකාරි සැළැස්මට අනුව භෞතික ප්‍රගතිය පිලිබඳව ඉදිරිපත් කරන ලද දත්තයන්ට අනුව 2022 වර්ෂය කිසිදු ප්‍රගතියක් ලබා ගෙන නොතිබූ යෝජිත වැඩ සටහන් 08 ක් ද සියයට 10 වඩා භෞතික ප්‍රගතියක් ලබා නොගත් යෝජිත වැඩ සටහන් 03 ක් ද විය. | ආයතනය විසින් නිසි ලේඛන පවත්වාගෙන නොයාම නිසා ප්‍රගතිය ලබා දීමට නොහැකි වීම, ආයතන සම්බන්ධීකරණය කර ගැනීමට නොහැකි වීම, මාදක රසායනාගාරයේ ප්‍රමාණවත් විද්‍යාත්මක නිළධාරින් නොමැති වීම. | සැලසුම්ගත ක්‍රියාකාරකම් අපේක්ෂිත පරිදි ඉටු කිරීමට කටයුතු කල යුතුය. |